සැ.යු.– මෙම ගැසට් පත්‍රයෙහි දෙමළ සහ ඉංග්‍රීසි භාෂාවන් වෙනවෙනම පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1959/21 - 2016 මාර්තු මස 24 වැනි බ්‍රහස්පතින්දා - 2016.03.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

**1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත**

**4 (2) වගන්තිය යටතේ කරනු ලබන පළකිරීම**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මෙහි මින්මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව සුපිරි වාසි බද්ද ගිණුම්කරණය සඳහා වූ විකල්පීයව සැලකිල්ලට ගැනීමේ ප්‍රකාශනය (SOAT)ආයතනය විසින් සම්මත කර 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පණතේ අරමුණු සඳහා මේ සමඟ පළකරමි. මෙම විකල්පීයව සැලකිල්ලට ගැනීමේ ප්‍රකාශනය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වූ කලී වහාම ක්‍රියාත්මක වන ලෙස බලාත්මක වේ.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි

අරුණ අල්විස්
ලේකම්

2016 මාර්තු මස 29 වැනි දින
කොළඹ 07,
මළලසේකර මාවත,
අංක 30 ඒ,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ දීය.

## 2015 අංක 10 දරණ මුදල් පනතේ 111 වන කොටස යටතේ සුපිරි වාසි බද්ද මත ගිණුම්කරණය සඳහා වූ විකල්පීයව සැලකිල්ලට ගැනීමේ ප්‍රකාශනය

### ප්‍රස්ථාවනාව

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත ව්‍යවහාර කිරීමට සෘජු බලපෑමක් සිදුවන මුදල් පනතට කරන ලද සංශෝධනය, නීති පැනවීමක් ලෙස ශ්‍රී ලංකා රජය විසින් අනුමත කර ඇත.

2015 අංක 10 දරණ මුදල් පනතේ 111 වන කොටස යටතේ සුපිරි වාසි බද්ද මත වන ගිණුම්කරණය උදෙසා විකල්පීයව සැලකිල්ලට ගැනීමේ ප්‍රකාශනයක් (SOAT) ස්ථාපනය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ (ශ්‍රීලවග) අරමුණ වේ. මෙහි අභිප්‍රාය වනුයේ ඉහත සඳහන් පනතේ ප්‍රතිඵලයක් වශයෙන් ඇතුලත් කර ඇති ඉදිරිපත් කිරීම අනුව අනුකූලවීම සඳහා සමාගම් / පුද්ගලයන් විසින් සුපිරි වාසි බද්ද කෙසේ ඉදිරිපත් කළ යුතු ද යන වග සඳහා ඔවුන් මෙහෙයවීමට හැකියාවක් ලබාදීමය. මුදල් පනතේ 111 වන කොටසේ 10(8) වගන්තියේ සඳහන් වනුයේ **"වෙනත් ඕනෑම ලිඛිත නීතියක ඕනෑම විධිවිධානයකට පටහැනිවීම නොතකා"** වෙනත් ඕනෑම නීතියක් මෙම විධිවිධානය මගින් අවලංගු වනු ඇත. 1995 අංක 15 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ හා විගණන ප්‍රමිත පනත යටතේ නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත එම පනතින් අවලංගු වන බැවින්, එම පනතේ අවශ්‍යතාවයන් අනුව සමාගමක බද්ද මූල්‍ය ප්‍රකාශනවල පිළිබිඹුවීමට හැකිවනු වස් පවතින මූල්‍ය වාර්තාකරණ ආකෘතිමය රාමුවට මෙම විසැගැප්‍ර (SoAT) නිකුත් කිරීමට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයට අවශ්‍ය වී ඇත. මෙම විසැගැප්‍ර මගින් LKAS 12 *"ආදායම් බදු"* 46 වන ඡේදය අවලංගු කෙරේ. තවද මුදල් පනතේ 111 වන කොටස යටතේ සුපිරි වාසි බද්ද ගෙවීමට නීතියෙන් බැඳුන සියලු සමාගම් කිසිඳු විකල්පයකට යටත් නොවී මෙම **විසැගැප්‍ර ව්‍යවහාර කළ යුතුය.**

### නිර්දේශ කිරීම

2015 අංක 10 දරණ මුදල් පනත යටතේ වන නෛතික අවශ්‍යතාවයන් ඉටුකිරීමේ දී, එම පනත යටතේ සුපිරි වාසි බද්ද ගෙවීමට නෛතිකව බැඳෙන පිළියෙළ කරන්නන් පහත සඳහන් පරිදි ගිණුම් තැබිය යුතුය; එවැනි වියදම් 2013 අප්‍රේල් 1 වන දිනෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂය සඳහා වියදමක් ලෙස සැලකිය යුතු නිසා, එය ප්‍රවර්තන මුදල් වර්ෂයේ (එනම් වර්ෂය දෙසැම්බර් අවසන් වන අස්තිත්ත්වයක් සඳහා 2015 ජනවාරි 1 දින / වර්ෂය මාර්තු අවසන් වන අස්තිත්ත්වයක් සඳහා 2015 අප්‍රේල් 1 දින)

තව ද මෙම ගැලපුම යෝජිත බැවින් 2015 දෙසැම්බර් 31 වැනි දින / 2015 මාර්තු 31 වැනි දින මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය නැවත ප්‍රකාශ නොකළ යුතු ය.

### මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම් සඳහා උදාහරණ

2015 ඔක්තෝම්බර් 30 වැනි දින සහතික කළ, 2015 අංක 10 දරණ මුදල් පනතේ 111 වන කොටසේ විධිවිධාන අනුව සමාගම රුපියල් මිලියන ×× ක සුපිරි වාසි බද්දකට යටත්ය. මෙම පනත අනුව 2013 අප්‍රේල් 1 වැනි දිනයේ ආරම්භ වූ තක්සේරු වර්ෂයට සම්බන්ධිත මූල්‍ය ප්‍රකාශනවල සුපිරි වාසි බද්ද වියදමක් ලෙස සැලකිය යුතුය. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්වල අවශ්‍යතාවයන් මෙම පනතෙන් අවලංගු වන බැවින් 2015 නොවැම්බර් 24 දාතමින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය නිකුත් කළ සුපිරි වාසි බද්ද ගිණුම්කරණය සඳහා වූ විකල්පීයව සැලකිල්ලට ගැනීමේ ප්‍රකාශනයෙන් (SoAT) නිර්දේශ කර ඇති, එම පනතේ අවශ්‍යතාවයන් ප්‍රකාරව සුපිරි වාසි බදු වියදම ගිණුම්ගත කළ යුතුය.

04-526

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.